# ගොටුකොලයෙන් රටක් අවදි කළ ගොටුකොල මහත්තයා

අනුරාධපුර දිසාවේ වැසියනට එක් ආහාරයක් පිළිබඳව නම් ස්ථිරසාර බලාපොරොත්තුවක් දිනපතා තබාගත හැකිය. ඒ ජනතාව අතර ඉතා ජනප්‍රිය කොළ ආහාරයක් වන ගොටු කොළය. එම ප්‍රදේශයේ සෑම සති පොළකම, දිනපතා පොළකම කඩපිලකම මෙම ආහාරය නොකඩවා අලෙවිය සඳහා සැපයේ

ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදනය හා අලෙවි රටාවේ නව පෙරලියක් කල මෙම ක්‍රියාවලිය කේන්ද්‍ර වී ඇත්තේ එක් පුද්ගලයෙකුගේ උත්සාහය තුලය. හේ නමින් සුදසිංහ දෙන්





ඡායා; රංජිත් දිසානායක

ඥනතිලකය. වඩාත් ප්‍රචලිත ලෙසින් කිවහොත් මහඉලුප් පල්ලමේ ''ගොටුකොළ මහත්තයා'' ය.

සිය උත්සාහය නිසා ගොවියෙකු ගෙන් තෑගි ලැබුන ගොටුකොළ පඳුරකින් කෘෂි සම්පත් භාවිතය නව වගා රටා, ජල පාලනය, අලෙවිකරණය, බෙදහැරීම ආදී අංශ රාශියකට අවශ්‍ය ආදර්ශන සපයන ගොවිපලක් බිහිකිරීමට ඔහුට හැකියාව ලැබී ඇත්තේය. ඒ සමගම නගරයේ ධනවතෙකුට නොදෙවැනි භෞතික සම්පත් ලබන්නට ද ඔහුට එමගින් අවකාශ ලැබිණ.

සම්ප්‍රදායික කෘෂිකර්ම භෝගයක් උපයෝගී කර නොගෙන මෙවැනි දස්කම් දක්වන්නට ඔහුට හැකියාව ලැබුනේ උත්සාහ යෙන්ම පමණක් නොවේ. එවැන්නටක අවශ්‍ය පසුබිමත්, දැණුමත්, කෞශල්‍යය හා අභ්‍යාසයත් ඔහු සතුව ඇත්තේය.

ඒ බව මහවැලි එච් 3 කලාපයට අයත් මහ ඉලුප්පල්ලමේ ඔහු සතුව ඇති ගොවිපල වෙත ගියවිට නියත ලෙසම වැට හෙන්නේය. අක්කර පනකිහන් (50) සමන්විත මෙම වත්තෙහි අක්කර විස්සකම (20) ගොටුකොළ වගාකර ඇත. ඒ තනි කරම නොවේ. ඉන් අක්කර 10 කම වවා ඇත්තේ පොල්වල අතුරු භෝගයක් විලසිනි. එයට අමතරව තවත් අක්කර 06ක් කෙසෙල් වල අතුරු භෝගයක් ලෙසිනි. මෙයට අමතරව ගොඩ කුඹුරක් ලෙස උපයෝගී කරගත හැකි අක්කර 05 ක එළවළුත් සමහ ද වගා කෙරේ.

''මෙම ගොවිපලේ ඇති විශේෂත්වය ලෙස ඉඩම් උප යෝගිතාවය දක්විය හැකි යැයි'' වසර 22 පළපුරුද්දක් ලත් කෘෂිකාර්මිකයෙකු වන ඥානතිලක මහතා ''ගොවි ජනතාවට'' පැවසීය. ''මෙම අතුරු භෝග වගා ක්‍රමයට අමතරව ගොවිපලේ පාරවල් හැරුණ විට අනෙක් සෑම බිම් අඟලක්ම වගාකෙරේ. පහත් බිම් අක්කර අටක (8) බිමක් කුඹුරු ලෙස භාවිතා වන අතර, අගල් ලෙස සැලකෙන පහත් බිම්වලට උචිත එකම වගාව වන කොහිල අක්කර තුන්කාලක් (3/4) වගාවේ. ඇල අයිනේ ඇති බඩවැටි වැනි සුළු ඉඩකඩවල මුකුණුවැන්න වගාකෙරේ. බලන්න මේ ඉඩමේ ඇති භූමිය මෙන් දෙගුණයක ප්‍රයෝජන අරගෙන තියෙනවා නේදැයි'' මඳ සිනා සහිතව හේ විමසීය.

වී, මිරිස්, ධාන්‍ය වැනි ජනප්‍රිය භෝගවලින් පරිභාහිරව සම්ප්‍රදායානුකූලව නොවන ගොටුකොළ නිෂ්පාදනයෙහි නියැලුනේ මන්දැයි විමසුවෙමු. ''එයට හේතු රැසක් තිබෙනවා. ප්‍රධානතම කරුණ සෑම දිනකම ආදායම ලැබීම, මාස ගණන් බලා සිට විශාල මුදලක් ලබනවාට වඩා සුළු වශයෙන් හෝ දිනපතා ආදායමක් ලබාගැනීම වඩා අගනේය. එහි අවදානමද අඩුය. වගාවක් ලෙස ගොටුකොළ වලට වැළඳෙන රෝගද අඩුය. එයට අමතරව ජල පාලනය හා ඉඩම සැකසුම වැනි මූලික වියදම්කර එක් වරක් වගාකළ විට වර්ෂ 03 ක් 04 ක් කාලය කට එම වගාවෙන් අස්වැන්න ලැබිය හැකිස අස්වැන්න කපා ගැනීමේ කාලය ද අඩුය. වැඩි දියුණුකළ වර්ගය මාස දෙකකින් අස්වනු ලබාදේ.

කෘෂි ද්‍රව්‍යවලට ඇති මූලික ප්‍රශ්නයක් වන අලෙවිකරණය පිළිබඳ විමසූ අවස්ථාවේ දී හේ සිය අතීතය ආවර්ජනය කළේය. ''මේ ගොටුකොළ වගාව ආරම්භ කලේ අහම්බෙන් වාගේ මං හඳුනන එක් ගොවි මහතෙක් දවසක් මට ගොටුකොළ පැල කිපයක් දුන්නා. (ඒ ඔහු කෘෂිකර්ම නිලධාරියෙකු ලෙස සේවය කළ අවධියේදී) එය ගොඩනවින් වගාකර මාස ගණනා වක් ගොටුකොළ ආහාරයට ගත්තා. මෙම වගාව පැතිරෙද්දී මම එක් තැනැත්තෙකුට ගොටුකොළ මිටි 100 බැගින් කපා දුන්නා, අසල පොළකට ගොස් විකුණන්න. මෙලෙස පටන් ගෙන ඉල්ලුම වැඩි වන විට නිෂ්පාදනය වැඩිකළා'' යැයි කියන්නේ කෘෂිකර්මයේ තවත් ප්‍රශ්නයක් විසඳන ආකාරය මනා ලෙස පෙන්වා දෙමින්.

මෙලෙස ඇරඹූ අලෙවි රටාව දැන් වෑන් රථ දෙකක, ප්‍රවාහන සේවාවකට පරිවර්තනය වී ඇත. ඒ සමඟම ගොවි පලට පැමිණ මිලදී ගන්නා සුළු වෙළෙඳුන් ගෙන්ද සැළකිය යුතු ඉල්ලුමක් තිබේ.

මේ කරුණු තවදුරටත් පැහැදිලි කළ ඥානතිලක මහතා, අක්කරයකින් සාමාන්‍යයෙන් කිලෝ ග්‍රෑම් දෙදහසක පමණ අස්වැන්නක් ලැබිය හැකි යයි පවසයි. අස්වනු ලැබෙන විට ගොවිපලේදීම රු. දහසක (1000) ක පමණ ආදායමක් ලබාගත හැකිය.

''ශ්‍රමය'' එය ප්‍රශ්නයක් වන්නේ දැනට පවතින වගා රටාව නිසයි. බොහෝ ගොවිපලවල වපුරන හා අස්වැන්න නෙලන කාලවලදී පමණය ශ්‍රමය අවශ්‍ය වන්නේ. එම නිසා එම කාලයට පමණක් ශ්‍රමය ලබාගැනීම ප්‍රශ්නයක් වනවා. එහෙත් අපේ ගොවිපලේ සේවකයනට සෑමදම වැඩ තියෙන ආකාරයට කටයුතු සකස්කර තිබෙනවා'' යයි සේවකයන්පනහකට (50) රැකියා සපයන සේ පවසයි.

අනාගත බලාපොරොත්තු ඥනතිලක මහතා පවසන අන්දමට අවට ගම්වාසීන් රාශියක්ද දැන් ඔහු අනුව ගොස් විශාල ගොටුකොළ ප්‍රමාණයක් වගා කරයි. ඒ නිසා මෙම ද්‍රව්‍ය මූලික කරගෙන යම් කර්මාන්තයක් ආරම්භ කිරීමට ඔහු දැන් උත්සාහ කරයි. ඒ සමඟම අපනයනටද අවධානය යොමු කර ඇති ඔහු, ගොටුකොළ පෙති නිපදවන සමාගමකට ද දිනපතා අමු ද්‍රව්‍ය සපයන්නෙක් ද වෙයි.

මෙම ව්‍යාපාරය දියුණුවීමේ රහස කුමක්ද?

එයට පිළිතුරු ලැබුනේ ජීවිතය පිළිබඳවත් පාඩම් උගත් වන ආකාරයටය. ''ජීවිතයේ සෑම කටයුත්තක්ම අභියෝගයක් නැත්නම් ප්‍රශ්නයක් ලෙස සැළකිය යුතුය. එම ප්‍රශ්නය මනා ලෙස තේරුම් ගෙන කැපවීමකින් ක්‍රියා කළහොත් ජයග්‍රහණය ලබා ගත හැකි යයි'' තවමත් අළුයම ගොවිපලට ගොස් රාත්‍රිය දක්වාම එහි නියැලෙන හේ කීවේය.

ඉතා සංකීර්ණ ප්‍රශ්නවලින් ගහන මෙම ක්‍රියාවලියට වෘත්තියෙන් ගුරුවරියකද හොඳ ගෘහනියකද වන බිරිඳ නන්ද රණතුංග ද ඉත සිතින් කැපවී සිටින්නිය. සැමියා නැති විටෙක පාලනය භාරවී ඇත්තේ ඇය වෙතය. අපේ සම්ප්‍රදායික ගැමි සුවඳ විහිදුවන සාර්ථක පවුලක් ලෙස හැඳින්විය හැකි ඔවුනට උසස් පෙළ සතර හදරන දියණියන් තිදෙනෙක්ද සිටිති. බාල පුත් 14 හැවිරිදි උදේනි පවුලේ සුරතලා ද වෙයි.

අවසන් වශයෙන්, මෙම ජයග්‍රහණයන්ට හේතුවූ ඥනතිලක මහතාගේ කෘෂිකර්ම පසුබිම ගැනද යමක් සඳහන් කළ යුතුවෙයි. වාගොල්ල කෘෂිකර්ම පුහුණු ආයතනයෙන් පළමු තැන ලබා කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයෙන්, උසස් ප්‍රතිඵල ලබාගෙන කෘෂිකර්ම නිලධාරියෙකු ලෙස ජීවිතය තෝරාගත් මොහු පිළිබඳව, දෙමව්පියන් විශාල බලාපොරොත්තුවක් තබා ඇත. ඒ බලාපොරොත්තුව රටටම වැඩක් වන පරිද්දෙන් සපල වී ඇති බව දැන් සක්සුදක් සේ පැහැදිළිය.

ඉදිරි කලාපය:

**කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත**

තේමාව යටතේ එළිදකී.